# අ.පො.ස උසස් පෙළ

# ව්‍යාපාර අධ්‍යයනය





## 7.1: ගණුදෙනු පහසු කර ගැනීම සඳහා මුදල් භාවිතයේ වැදගත්කම තහවුරු කරයි.

## 7.1 නිපුණතා මට්ටම :

**ගණුදෙනු පහසු කර ගැනීම සඳහා මුදල් භාවිතයේ වැදගත්කම තහවුරු කරයි.**

## ඉගෙනුම් ඵල :

- මුදල් යන්න අර්ථ දක්වයි.
- හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාවය පෙන්වා දෙයි.
- මුදලේ කාර්යයන් හඳුන්වා ඒවායේ වැදගත්කම නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- හොඳ මුදලක ලක්ෂණ පෙන්වා දෙයි.
- හුවමාරුවේදී භාවිතා වන විවිධ මුදල් වර්ග පැහැදිලි කරයි.

**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.


**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**මුදල් යනු, භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගනු ලබන ඕනෑම දෙයකි.**



**භාණ්ඩ හුවමාරුව සිදු වීම.**



**භාණ්ඩ හුවමාරුව සිදුකර ගත නොහැකිව ගැටළු මතු වීම. (වුවමනා නොගැලපීම.)**



**මුදල් දී භාණ්ඩ හෝ සේවා ලබා ගැනීම.**



**චෙක්පත් දී භාණ්ඩ මිලදී ගැනීම.**



**විද්‍යුත් මුදලින් ගෙවා (ණයපත්/හරපත්) භාණ්ඩ මිලදී ගැනීම.**

**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**<u>මුදලේ අවශ්‍යතාවය :</u>**

භාණ්ඩ හුවමාරුවේ දක්නට ලැබුනු දුෂ්කරතා නැතිකර, හුවමාරුව පහසුකර ගැනීම සඳහා පොදුවේ සැම දෙනාම පිළිගනු ලබන හුවමාරු මාධ්‍යක අවශ්‍යතාවය ඇති විය. ඒ අනුව හුවමාරු මාධ්‍ය ලෙස මුදල් භාවිතයට පැමිණි අතර, එය භාණ්ඩ හා සේවා හුවමාරුව පහසු කරලීය.

## මුදලේ කාර්යයන්:-

**(1) විනිමය මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම. (A medium of exchange)**



භාණ්ඩ හා සේවා හුවමාරුවේදී අතරමැදියෙකු ලෙස මුදල් කටයුතු කරයි.

**(2) වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස ක්‍රියා කිරීම.**

**(Standard of value)**




භාණ්ඩ හා සේවාවල අගය මැනීම සිදු කරන්නේ මුදල් මගිනි. එය මිල (price) ලෙස හඳුන්වයි. මෙමගින් ගිණුම් තැබීම පහසු වී ඇති අතර, එම නිසා ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම කියා ද මෙය හඳුන්වයි.


Copyright © e-thaksalawa.moe.gov.lk

### (3) වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම. (Store of Value)



මුදල් රැස්කර තබා ගත හැකි අතර, අනාගතයේදී ප්‍රයෝජනයට ගත හැකිය. එනම් මුදල් වටිනාකම රැස්කිරීමේ මාධ්‍යයක් ලෙස කටයුතු කරයි.

### (4) විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

**(Differed Future Payment)**



අනාගතයේ දී මුදල් ගෙවීමට, වර්තමානයේ ගිවිස ගැනීම කළ හැකි වන්නේ මුදල් නැමැති මාධ්‍යය නිසාය.

එම නිසා මෙය අනාගත ගෙවුම් මාධ්‍යයක් යනුවෙන් ද හැඳින්වේ.

### හොඳ මුදලක ලක්ෂණ

1. පොදු පිළිගැනීමක් තිබීම.
2. කල් පැවැත්මක් තිබීම.
3. අනුකරණයේ දුෂ්කරතාව.
4. පහසුවෙන් ගෙන යා හැකි වීම.
5. පහසුවෙන් හඳුනා ගත හැකි වීම.
6. කුඩා කොටස්වලට බෙදිය හැකි වීම.



The National e-learning Portal for The General Education

Copyright © e-thaksalawa.moe.gov.lk








The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk









Copyright © e-thaksalawa.moe.gov.lk

මුදල් වර්ග

- ව්‍යවහාර මුදල් / වලංගු මුදල් Currency
- බැංකු මුදල් Bank Money
- ආසන්න මුදල් Near Money
- විද්‍යුත් මුදල් E-money

### ❖ ව්‍යවහාර මුදල් / වලංගු මුදල් (Currency)





රටක මූල්‍ය අධිකාරියේ නියෝග මත නිකුත් කරන කාසි හා නෝට්ටු මෙලෙස හැඳින්වේ. මේවායේ ද්‍රවශීලීතාවය (වත්කමක් මුදල් බවට පත් කිරීමේ සීඝ්‍රතාවය) 100% කි.



Copyright © e-thaksalawa.moe.gov.lk

## ❖ බැංකු මුදල් (Bank Money)

වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම්වල ශේෂ බැංකු මුදල් නමින් හැඳින්වේ. මෙම මුදල් ගෙවීම් කටයුතු කරන්නේ චෙක්පත් මඟිනි. මේවායේ ද්‍රවශීලතාවය ව්‍යවහාර මුදල්වලට වඩා අඩුය.











## ❖ ආසන්න මුදල් (Bank Money)

පහසුවෙන් හා එකරම් මූල්‍ය අලාභයක් නොවිඳ කෙටි කලකින් මුදල් බවට පරිවර්ථනය කර ගත හැකි මුදල් මෙනමින් හැඳින්වේ. ඉතිරි කිරීම් හා ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා මීට නිදසුන් කිහිපයකි.







Copyright © e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for The General Education

### ❖ විද්‍යුත් මුදල් (E-Money)


තොරතුරු තාක්ෂණයේ සහ ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිපලයක් ලෙස බිහි වී ඇති, දේශීය හා විදේශීය ගණුදෙනුවල දී ගෙවීම් කිරීමට යොදා ගනු ලබන මුදල් විද්‍යුත් මුදල් ලෙස හැඳින්වේ.

උදාහරණ -

- <u>හර කාඩ්පත් (Debit Card)</u>

තම බැංකුවේ පවතින තැන්පතු ප්‍රමාණයෙන්, භාවිත කරනු ලබන මුදල් ප්‍රමාණ විද්‍යුත් ලෙස හර වී (ගිණුමෙන් අඩු වන ලෙස) සටහන් වන කාඩ්පත් හර කාඩ්පත් ලෙස හැඳින්වේ. මෙම කාඩ්පත් සඳහා බැංකු ගිණුමක් තිබිය යුතුය.








- <u>ණය කාඩ්පත් (Credit Card)</u>

කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා, අනුමත ආයතන වලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ්‍ය බැංකුවක් හෝ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් ණය කාඩ්පත් ලෙස හැඳින්වේ. ණය කාඩ්පත් ලබා ගැනීමට බැංකු ගිණුමක් පැවතීම අනිවාර්ය නොවේ.








**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.

**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- <u>පෙර ගෙවුම් කාඩ්පත් (Prepaid Card)</u>

කලින් මුදල් ගෙවා ලබා ගෙන, එහි සඳහන් වටිනාකම දක්වා භාණ්ඩ හා සේවා ලබාගෙන තම අවශ්‍යතා හා වුවමනා, ඉටු කර ගත හැකි කාඩ්පත් මෙනමින් හැඳින්වේ.










**විද්‍යුත් මුදල් ලෙස භාවිත වන කාඩ්පත් මඟින් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම්.**

- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර - Automatic Teller Machine – (ATM යන්ත්‍ර)




- ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර - Automatic Deposits Machine




**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.

**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk


- චෙක්පත් තැන්පතු යන්ත්‍ර - Cheques Deposits Machine – (CMD යන්ත්‍ර)



- වෙළඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල - (Electronic Funds transfer point of sales)



- ටෙලි බැංකු පහසුකම් - Tele Banking





Copyright © e-thaksalawa.moe.gov.lk

- අන්තර්ජාල බැංකු කටයුතු - (On line banking / Internet banking)




- ටෙලිවිෂන් බැංකු පහසුකම් - Television Banking






Copyright © e-thaksalawa.moe.gov.lk

## රටක මුදල් ආයතන පද්ධතියේ වැදගත්කම.

රටක මූල්‍ය ස්ථායීතාවය පවත්වා ගෙන යාම සඳහා මූල්‍ය ආයතන පද්ධතියේ ක්‍රියාකාරීත්වය වැදගත් වේ. ස්ථාවර මූල්‍ය පද්ධතියක්, තැන්පතුකරුවන් හා ආයෝජකයින් සඳහා සතුටුදායක පරිසරයක් නිර්මාණය කරයි. එහි දී සෑම විටම කාර්යක්ෂම ව ගෙවීම් හා පියවීම් කටයුතු කල හැකි වන පරිදි මූල්‍ය පද්ධතියට ක්‍රියා කළ හැකි වේ.

එනම්, ස්ථාවර මූල්‍ය පද්ධතියක් තුල ආයතන, වෙළඳපොළවල් හා ගෙවීම් පියවීම් පද්ධතිය කාර්යක්ෂම ව ක්‍රියාත්මක වන අතර, බැංකු, මූල්‍ය ගෙවීම් පියවීම් සම්බන්ධ අර්බුධ නොමැත. එවිට මූල්‍ය පද්ධතිය පිළිබඳ මහජනතාවගේ විශ්වාසය ඇති වේ. මේ නිසා ආයෝජනය සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය ප්‍රවර්ධනය කරයි.




**අන්තර්ගතය :** සී.සී.මලවිපතිරණ, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.

**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk